**මාධ්‍ය ප්‍රවණතා**

# පුවත්පත්වලට නව තාක්ෂණයේ බලපෑම

*නව තාක්ෂණය නිසා පුවත්පතට දැන්වීම් එවීමේ ක්‍රියාවලියෙහි ලොකු වෙනස්කම් සිදු වී ඇත. ලොකු දැන්වීම් සියල්ලම පාහේත් ලුහුඬු දැන්වීම්වලින් සියයට හතළිහක් පමණත් පුවත්පතට යොමු කෙරෙන්නේ ඩිජිටල් තාක්ෂණය හරහා ය. මේ නිසා දැන්වීමක් පුවත්පතට බාර දීමේ අවස්ථාවේ සිට එය පුවත්පතේ පළවීමේ අවස්ථාව දක්වා ඇති, කාලය වැය වන පියවර ගණනාවක් අත්හැර දමා ඇත. මෙම වෙනස්කම් සහ ප්‍රවෘත්ති පිටු සඳහා යොදා ගන්නා ප්‍රතිරූප ගැන්වීමේ (ඉමේජිං) උපකරණයේ භාවිතයත් නිසා පුවත්පත් පිටුවල පළවන දැන්වීම්වල සියුම්බව මතු කර දැන්වීමේ ගුණය බෙහෙවින් වර්ධනය වී ඇත.*

**සී. පී. කුරුප්පු**

ඇමරිකාවේ 'වෝල් ස්ට්‍රීට් ජර්නල්' පුවත්පත තුළ පසුගිය වසර පහ ඇතුළත සිදු වූ වෙනස්කම් ඇසුරෙන්, නව තාක්ෂණය නිසා පුවත්පත් කලාවේදීන් ගේ වැඩ කටයුතුත් පුවත්පත් ප්‍රකාශයට පත් කිරීමේ කටයුතුත් පසුගිය කාලය තුළ තදබල ලෙස වෙනස් වී ඇති අයුරු පසුගිය ලිපියෙන් (නවයුගය 2001 අප්‍රේල්) අපි සාකච්ඡා කළෙමු.

එම වෙනස්කම් ගැන අදහස් දැක්වීම පිණිස 'වෝල් ස්ට්‍රීට් ජර්නල්' පුවත්පතේ ප්‍රකාශකයා සහ එම පුවත්පත අයිති ඩව් ජෝන්ස් සමාගමේ ප්‍රධාන විධායක නිලධාරියා වන පීටර් කැන් එම පුවත්පතේ පාඨකයනට මේ වසර මුලදී ලියූ ලිපියක අඩංගු වූ කරුණු අපි ප්‍රයෝජනයට ගනිමු.

නව තාක්ෂණය නිසා පුවත්පත් දැන්වීම්වල ඇති වී තිබෙන වෙනසත් නව තාක්ෂණය මධ්‍යයේ කිසිම වෙනසක් නොවී පවතින පුවත්පත් කලාවේ හර පද්ධතියත් ගැන අපි මෙම ලිපියෙන් කතා බස් කරමු.

'වෝල් ස්ට්‍රීට් ජර්නල්' වැනි පුවත්පතක පළ වන ද අතුරෙන් ප්‍රවෘත්ති පමණක් නොව දැන්වීම් ද වැදගත් වෙයි. නව තාක්ෂණය නිසා පුවත්පතට දැන්වීම් එවීමේ ක්‍රියාවලියෙහි ලොකු වෙනස්කම් සිදු වී ඇත. ලොකු දැන්වීම් සියල්ලම පාහේත් ලුහුඬු දැන්වීම්වලින් සියයට හතළිහක් පමණත් පුවත්පතට යොමු කෙරෙන්නේ ඩිජිටල් තාක්ෂණය හරහා ය. මේ නිසා දැන්වීමක් පුවත්පතට බාර දීමේ අවස්ථාවේ සිට එය පුවත්පතේ පළවීමේ අවස්ථාව දක්වා ඇති, කාලය වැය වන පියවර ගණනාවක් අත්හැර දමා ඇත. මෙම වෙනස්කම් සහ ප්‍රවෘත්ති පිටු සඳහා යොදා ගන්නා ප්‍රතිරූප ගැන්වීමේ (ඉමේජිං) උපකරණයේ භාවිතයත් නිසා පුවත්පත් පිටුවල පළවන දැන්වීම්වල සියුම්බව මතු කර දැන්වීමේ ගුණය බෙහෙවින් වර්ධනය වී ඇත. නව තාක්ෂණය නිසා දැන්වීම් කරුවනට තම දැන්වීම පුවත්පතේ පළවන ආකාරය පිළිබඳ විස්තරයකුත් තම දැන්වීමේ 'ටියර් ෂීට්' නමින් හැඳින්වෙන සෝදු පිටපතකුත් අන්තර්ජාලය හරහා ලබා ගැනීමට හැකි වී තිබේ. "මෙම වෙනස්කම් වැදගත් ය. ව්‍යාපාරික අංශයෙන් සැලකෙන විට ඇතැම් වෙනස්කම් විප්ලවකාරී ය. මේ අතර වෙනස් නොවී පවතින ද බෙහෙවින් විවේචනාත්මක යැයි අපි තර්ක කරමු. නොවෙනස් ව පවතින්නේ වටිනාකම්" යැයි පීටර් කැන් පවසයි.

ඔහු එම වටිනාකම් මෙසේ එකින්එක ගෙනහැර දක්වයි.

**සාධාරණත්වය සහ නිරවද්‍යතාව:** ප්‍රවෘත්තියක් හරියාකාරව ලබා ගැනීම එහි ඇති සම්බන්ධය හරිහැටි පිළිබිඹු වන අයුරින් එය ඉදිරිපත් කිරීම, එහි නිරවද්‍යතාව සහ සාධාරණත්වය වෙනුවට අප ළඟ විකල්ප නැත. ඇමරිකාවේ ප්‍රවෘත්ති මාධ්‍යයන් අතර වැඩිම විශ්වසනීයත්වයක් ඇත්තේ 'වෝල් ස්ට්‍රීට් ජර්නල්' පුවත්පතට බව සමීක්ෂණවලින් පෙන්නුම් කිරීම අපට ලැබුණ පුලිට්සර් ත්‍යාග 23 ඇතුළු සියලු සම්මානවලටත් වඩා අපට අගනේ ය.

**ප්‍රවෘත්ති සහ අදහස් අතර පැහැදිලි වෙනසක් තිබීම:** හැම පුවත්පතක ම ප්‍රවෘත්ති සහ අදහස් පළ කිරීම සඳහා වෙන් වූ ස්ථාන ඇත. එසේ ම සිද්ධීන් සහ එවැනි සිද්ධීන් ගණනාවක් එක් වී නිර්මාණය වන රටාවන් වාර්තා කිරීමට සහ විශ්ලේෂණය කිරීමටත්, එම සිද්ධීන් සහ රටාවන් පිළිබඳ මත පළ කිරීමටත් වෙන් වූ ස්ථාන පුවත්පත්වල තිබේ. 'වෝල් ස්ට්‍රීට් ජර්නල්' පුවත්පත මෙම කාර්යයන් දෙකෙහි ම යෙදී සිටිනවා පමණක් නොව ඒ අංශ දෙකෙන් ම විශිෂ්ටත්වයට ද පත්ව සිටි යි. හොඳම ප්‍රවෘත්ති වාර්තාවට සහ හොඳම ප්‍රවෘත්ති විග්‍රහයට පිරිනැමෙන පුලිට්සර් ත්‍යාග දෙක ම පසුගිය වසරේ දිනා ගන්නා ලද්දේ ද අප ගේ පුවත්පත විසිනි. එහෙත් ප්‍රවෘත්ති පළ කිරීම සහ මත පළ කිරීම යන නාර්ය දෙකම අපි වෙන් වෙන්ව කරගෙන යමු. අප ගේ ප්‍රවෘත්ති වෙනම පළ වෙයි. මත පළ කිරීම ද අපි පැහැදිලිවම වෙනම කරමු.

**කිසියම් අරමුණක් වෙනුවෙන් පෙනී සිටීම:** ඕනෑම ප්‍රකාශනයක් නිශ්චිත අරමුණක් වෙනුවෙන් පෙනී සිටිය යුතු යැයි අප විශ්වාස කරමු. 'වෝල් ස්ට්‍රීට් ජර්නල්' පුවත් පතේ කර්තෘ මණ්ඩලයේ දර්ශනය වන්නේ "නිදහසේ ජනතාව, නිදහස් වෙළෙඳ පොළ" යන්න යි. හැම කල්හි ම අපි මම අරමුණ ඇතිව ක්‍රියා කළෙමු. මෙම අරමුණ මින් කවරදටත් වඩා අදට වටී යි. එය ලොව පුරා පැතිරෙනු දක්මට අප කැමති ය. අප දේශපාලනඥයන්ට අනුග්‍රහ නොදක්වන්නේ කාට පක්ෂපාත විය යුතු දැයි අප හරි හැටි නොදන්නා ම නිසා නොවේ. පුද්ගලයිනට වඩා ප්‍රතිපත්ති අපට වටිනා බැවිනි.

**ප්‍රවෘත්ති සහ දැන්වීම් අතර 'චීන මහා ප්‍රාකාරයක්' තැනීම:** අප ප්‍රවෘත්ති මත පළ කිරීම්වලින් වෙන් තර තබනවා වගේම ප්‍රවෘත්ති දැන්වීම් වලින් ද වෙන් කර තබමු. එහෙත් ප්‍රවෘත්ති මෙන් ම දැන්වීම් ද අපට එක ලෙස වැදගත් ය. අප වඩාත් ම අගය කරන සම්පත අප ගේ විශ්වාසනීයත්වය යි. එය රැක ගැනීම පිණිස අප ගේ වාර්තාකරුවනුත් කතුවරුනුත් දැන්වීම්කරුවන්ගෙන් ඈත් වී ස්වාධීනව ක්‍රියා කරති. එසේම දැන්වීම්කරුවනුත් තම දැන්වීම් වටේට විශ්වාසනීය ප්‍රවෘත්ති පළ වී තිබෙනවා දැකීමට කැමති ය.

**වටිනාකමට වටිනාකමක් ඉල්ලා සිටීම:** අපට අන්තිමට වටින්නේ වටිනාකම් ය. එයින් අදහස් කරන්නේ අප ඔබට නිෂ්පාදනයක් ලබා දීම යි. එම නිෂ්පාදනය ඔබට අවස්ථානුකූලව ප්‍රයෝජනවත් විය යුතු ය. ඔබ දැනුවත් කළ යුතු ය. අප එය ඉටු කළ විට ඔබ ද ඒ සඳහා වටිනාකම අපට ගෙවිය යුතු යැයි අපි සිතමු. අප දායක මුදල් බොහෝ විට සම්පූර්ණයෙන් ම ලබාගන්නේ එබැවිනි. දායක මුදල් ලබාගැනීම පිණිස සහන දීමනා හෝ ත්‍යාග පිරිනැමීම හෝ අපි නොකරමු. දැන්වීම්කරුවන් වෙනුවෙන් ද අපේ

දැන්වීම් ගාස්තු අපි කල් ඇතිව ප්‍රකාශයට පත් කරමු. අන්තර්ජාලය හරහා අපේ පුවත්පත් කියවන පාඨකයන් සඳහා ද ගාස්තු ක්‍රමයක් ඇත.

ඉහත සදහන් කළ වටිනාකම් කිසිවක් තාක්ෂණය නිසා වෙනස් වන්නේ නැත.

පීටර් කෑන් සඳහන් කලේ ඔහුගේ පුවත් පතෙහි ගත වූ වසර පහ ඇතුළත වෙනස් වූ තාක්ෂණය ගැන යි. තාක්ෂණය සැමදා වෙනස් වෙයි. එය අපේ හිතසුව පිණිස අපි සැමදා යොදා ගනිමු. අදහස් පළ කිරීම පිණිස තාක්ෂණය යොදා ගැනීම ඇරඹුණේ සෑහෙන කලකට ඉහතදී ය. චීන ජාතිකයන් තීන්ත සහ කඩදාසි තාක්ෂණය සොයා ගැනීමත් ජර්මනියේ ජොහැන්ස් ගුටෙන්බර්ග් මුද්‍රණ යන්ත්‍රය නිපදවීමත් අදහස් පළ කිරීම පිණිස නව තාක්ෂණය සොයා ගිය ගමනේ අතීත සන්ධිස්ථාන වෙයි. අන්තර්ජාලය හරහා ඔන්ලයින් ප්‍රකාශන පළ වීම ආරම්භ වන තෙක් තීන්ත සහ කඩදාසි පාවිච්චි කරමින් මුද්‍රණ යන්ත්‍ර යොදා ගෙන පුවත්පත් එළි දැක්විණි. තාක්ෂණය අද ඉතා වේගයෙන් වෙනස් වෙයි. තව වසර පහකින් ඇතිවන තාක්ෂණ වෙනස්කම් පුවත්පත් පළ කිරීම කෙරෙහි කෙසේ බලපාන්නේදැයි අද නිශ්චිත ලෙස කිව නොහැකි ය.

එහෙත් පුවත්පත් කලා ආචාර ධර්ම එසේත් නැත්නම් වටිනාකම් එසේ නොවේ. ඒවා තාක්ෂණය මෙන් වෙනස් විය නොහැකි ය. තාක්ෂණය උපකරණ භාවිතයකි. එහෙත් වටිනාකම් අතින් ග්‍රහණය කළ නොහැකි උසස් මානසික තත්ත්වයකි. ප්‍රවෘත්තියක් සදෙස් වීම, පක්ෂග්‍රාහී වීම හෝ එය තුළට මත රිංගවීම වැනි කරුණු නිසා එම ප්‍රවෘත්තියෙහි වටිනාකම නැති වෙයි. එසේම එවැනි ප්‍රවෘත්තියකට සම්බන්ධ පුද්ගලයනට හෝ ආයතනවලට සිත් අමනාපකම් ඇති වීමටත් පාඩු විඳීමටත් සිදු වෙයි. එය ප්‍රවෘත්තියට සම්බන්ධ පුද්ගලයාට හෝ ආයතනයට පමණක් සිදුවන පාඩුවක් නොවේ. එවැනි ප්‍රවෘත්ති පළ කිරීම නිසා පුවත්පතේ විශ්වසනීයත්වය බිඳ වැටෙ යි. එය පුවත්පතට ලොකු පාඩුවකි. පුවත්පත් කලාවේදීන්ගේත් පුවත්පත පළ කිරීමේ ත් කටයුතු වඩාත් ඉහළ මට්ටමක ට පත් කිරීම පිණිස තාක්ෂණ දියුණුව යොදා ගත හැකි වුවත් පුවත්පතක තිබිය යුතු හර පද්ධතිය වෙනස් කිරීමෙන් පුවත්පත උසස් මට්ටමකට පත් කළ නොහැකි ය.

එබැවින් පීටර් කෑන් ගේ අදහස් 'වෝල් ස්ට්‍රීට් ජර්නල්' පුවත්පතට පමණක් නොව ලොව වෙනත් ඕනෑ ම පුවත්පතකට එක ලෙස වැදගත් වනු ඇත.

❑

## ලොව ප්‍රථම අභ්‍යවකාශ සංචාරකයා

